## ඇල්කඩුව ප්ලාන්ටේෂන්ස් ලිමිටඩ් - 2016

---

ඇල්කඩුව ප්ලාන්ටේෂන්ස් ලිමිටඩ් හි 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම.

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම.

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව, ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.13,535,257 ක් වූ වාහන 29 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 39 හි 46 ඡේදය ප්‍රකාරව, මූල්‍ය වත්කම් සාධාරණ වටිනාකමට ගිණුම්ගත කලයුතු වුවත්, සමාගම සතු රු.44,372,810 ක ස්ථාවර තැන්පතු වටිනාකම 2013 වර්ෂයෙන් පසු සාධාරණ අගයට ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 41 හි 12 ඡේදය අනුව, ජීව විද්‍යාත්මක වත්කම් මූලිකව හඳුනාගැනීමේදී හා සෑම වාර්තාකරණ කාලපරිච්ඡේදයක් අවසානයේදීම වත්කම් විකිණීමේදී දැරීමට සිදුවන පිරිවැය අඩු කර සාධාරණ අගයට ඉදිරිපත්කල යුතු වුවත්, 2016 දෙසැම්බර් 31 දිනට එම වත්කම් අගය කිරීමකින් තොරව 2015 දෙසැම්බර් 31 දිනට පාරිභෝජ්‍ය ජීව වත්කම් ලෙස දක්වා තිබූ රු.278,565,316 ක වටිනාකම සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වත්කම් ලෙස දක්වා තිබුණි.

(ඈ) තේ, රබර්, පොල් හා වෙනත් වගාවන්වල පරිනත වීමේ කාලය හඳුනාගැනීම සඳහා නිශ්චිත ප්‍රතිපත්තියක් හඳුනාගෙන නොමැති අතර පරිනත වීමේ සම්මත කාලය ඉක්මවා තිබූ පිරිවැය රු.125,128,573 ක් වූ එම වගාවන් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් පරිනත නොවූ වගාවන් යටතේ වාර්තා කර තිබුණි. ඒ හේතුවෙන් ඊට අදාළ ක්ෂය ගිණුම්වලින් අත්හැරී තිබුණි.

(ඉ) සමාගම විසින් සේවක භාරකාර අරමුදල වෙත 1995 වර්ෂයේදී නිකුත්කරන ලද රු.5,000,000 ක් වටිනා ණයකර 2000 වර්ෂයේදී නිදහස් කිරීමට නියමිතව තිබුණද, මෙම වාර්තාවේ දින වනවිටත් නිදහස් කර නොතිබූ අතර ඒ පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමද සිදුකර නොතිබුණි. තවද 2000 ජූනි 15 දින සිට ගෙවිය යුතු පොලී ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් ප්‍රවර්තන වර්ෂයේ පොළි වියදම වූ රු.720,000 ක්ද, ඇතුළුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු පොළි වියදම් රු.11,880,000 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) 2007 වර්ෂයේ දී ආරම්භ කර තිබූ රත්වත්ත වතුයායේ පිරිවැය රු.6,396,615 ක් වූ පොල් වගාව වර්තමානය වන විට අසාර්ථකව පැවතියද, අදාල පිරිවැය ගිණුම් මගින් ලියා හැරීමට කටයුතු නොකර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පරිනත නොවූ ධාරක ජීව විද්‍යාත්මක වත්කම් යටතේ දක්වා තිබුණි.

(උ) 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව ජනතා වතු සංවර්ධන මණ්ඩලයෙන් හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවෙන් සමාගම වෙත ලැබිය යුතු ලෙස දක්වා තිබූ ශේෂයන් හා එම ආයතන මගින් ලබාගත් ශේෂ සනාථනයන් අතර පිළිවෙළින් රු.5,538,252 ක හා රු.147,343 ක වෙනසක් විය.

(ඌ) වතු සේවක සංවර්ධන අරමුදලට (Plantation Human Development Trust Fund) 2016 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු දායක මුදල් වලට අදාලව එම ආයතනයෙන් ලබාගත් ශේෂ සනාථනයන් හා සමාගමේ ගිණුම් ශේෂ අතර රු.3,977,943 ක වෙනසක් විය.

(එ) සෙලගම වතුයායට අයත් දේපල ඇපයට තබමින් 2011 වර්ෂයේදී රජයේ බැංකුවකින් ලබාගෙන තිබූ රු.15,000,000 ක ණය මුදල සම්බන්ධයෙන් 2016 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ණය ශේෂයක් නොමැති බව බැංකුව විසින් සනාථ කර තිබුණද සමාගමේ ගිණුම් අනුව ගෙවිය යුතු ලෙස රු.2,778,246 ක ණය වගකීමක් දක්වා තිබුණි.

(ඒ) කිරිගව පාලන ව්‍යාපෘතිය වෙනුවෙන් රු. 2,125,614 ක පිරිවැයක් දරා 2009 වර්ෂයේදී ඉදිකළ ගොඩනැගිලි එම ව්‍යාපෘතිය යටතේ ප්‍රග්ධනිත කර තිබුණද එම වර්ෂයේදී ඉඩම් හා ගොඩනැගිලි සංවර්ධන වියදම් ලෙස නැවත ප්‍රාග්ධනිත කිරීම හේතුවෙන් ගොඩනැගිලි වටිනාකම එම අගයෙන් අධිගණනය වී තිබුණි.

(ඔ) 2015 හා ඊට පෙර වර්ෂයන්ට අදාල රු. 2,856,838 ක ස්ථාවර තැන්පතු පොළී ආදායම් සමාලෝචිත වර්ෂයට අදාල පොළී ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබූ අතර සමාලෝචිත වර්ෂයට අදාල රු. 2,332,946 ක පොළී ආදායමක් ගිණුම්ගතකර නොතිබුණි.

(ඕ) සමාලෝචිත වර්ෂයේදී මුදලින් ලද රු.2,340,664 ක පොළී ආදායම මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී ගැලපීම් යටතේ අඩු කර දක්වා තිබුණද එම ආදායම ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය යටතේ මුදල් ගලා ඒමක් ලෙස දක්වා නොතිබුණි.

(ක) සමාලෝචිත වර්ෂය අවසානයේදී පැවති අඩමාණ ණය වෙන්කිරීම් වටිනාකම රු.4,186,615 ක් වුවත් එම වටිනාකම ගණනය කළ ආකාරය හා ඊට අදාල ණයගැති වටිනාකම තහවුරු කරගැනීමට අදාල සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

(ඛ) වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් යටතට ඇතුලත් නොවන වටිනාකම රු.3,777,650 ක ගිණුම් ශේෂ 10 ක් ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ග) වටිනාකම පිළිවෙලින් රු.77,591,127 ක් හා රු.23,222,650 ක් වූ ණයගැති හා ණයහිමි ශේෂ වලට අදාල ශේෂ සනාථන විගණනය සඳහා ඉදිරිපත් නොවුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන
-----------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට ඇල්කඩුව ප්ලාන්ටේෂන්ස් ලිමිටඩ් හි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.1.1 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තාව
----------------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163(2) වගන්තිය මගින් නියමකරන පරිදි මම පහත සඳහන් කරුණු දක්වමි.

(අ) මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය සහ සීමා කිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණු වලට යටත්ව විගණනය සඳහා අවශ්‍ය සියළුම තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණ වලින් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ දැක්වෙන අවශ්‍යතාවයන් හා අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

## 2.2 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.

-------------------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| | ---------------------------- | ------------------- |
| (අ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනතේ II වැනි කොටසේ 5 (1) ජේදය | සේවායෝජකයකු යටතේ වර්ෂ පහකට නොඅඩු කාලයක් සේවය කළ සේවකයෙකු සේවයෙන් අස්වී, විශ්‍රාම ගොස් හෝ නීතියෙන් හෝ සේවයෙන් ඉවත්කර මාසයක් තුල පාරිතෝෂික මුදල් ගෙවිය යුතු වුවත්, සමාගමේ වර්ෂ 05 කට වඩා වැඩි කාලයක් සේවය කර සේවකයින් 998 දෙනෙකු සේවයෙන් ඉවත් වී මාස 01 සිට වර්ෂ 15 ත් අතර කාලයක් ගතවී තිබුණද, එම සේවකයින්ට පාරිතෝෂික මුදල් නොගෙවීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අධිභාර ඇතුළුව ගෙවිය යුතු පාරිතෝෂික වගකීම රු.87,003,386 ක් වී තිබුණි. |
| (ආ) | 2015 ජූලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | රාජ්‍ය ආයතන සතු අබලන් හා භාවිතා කිරීමට නොහැකි වාහන අපහරණය කිරීම ප්‍රමුඛ කාර්යයක් ලෙස හඳුනාගෙන මාස 3ක් ඇතුළත අපහරණය කරන ලෙස මෙම චක්‍රලේඛය මඟින් සඳහන් කර තිබුණද, 2015 වර්ෂය අවසන් වන විට ධාවන තත්ත්වයේ නොතිබූ වාහන 12 ක් අපහරණය කිරීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතු කර නොතිබුණි. |
| (ඇ) | 2015 මැයි 25 දිනැති අංක පීඊඩී 1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | නිල වාහන දීමනා හිමිකම නොමැති නිලධාරීන් දෙදෙනෙකු සඳහා සමාලෝචිත වර්ෂයේදී ප්‍රවාහන හා ඉන්ධන දීමනා ලෙස රු.696,000 ක් ගෙවා තිබුණි. |
| (ඈ) | 1994 ජූනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 2009 මැයි 26 දිනැති අංක 39 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය | අනුමත වැටුප් හා දීමනා වල ඇතුළත් නොවන වැටුප් හා දීමනා ගෙවීමට පෙර වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශය හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වුවත් අවසර ලබා ගැනීමකින් තොරව සමාගමේ සභාපතිවරයාට හා සාමාන්‍යාධිකාරීවරයා වෙත සමාලෝචිත වර්ෂයේදී රු.838,080 ක කම්කරු දීමනා ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මූල්‍ය ප්‍රතිඵලය රු.62,756,178 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.26,922,928 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.35,833,250 ක පිරිහීමක් පෙන්නුම් කෙරිණි. සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන භෝග වගාවන්ගෙන් ලද අලාභය පෙර වර්ෂයට සාපේක්ෂව රු.25,698,422 කින් වැඩිවීම මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

**4.1.1.1 සමාලෝචිත වර්ෂයේ අයවැය ඉලක්ක සපුරා ගැනීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

(අ) රත්වත්ත වතුයායේ සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත අමු තේ දළු අස්වැන්න කිලෝග්‍රෑම් 725,000 ක් වුවත් සත්‍ය ඵලදාව කිලෝග්‍රෑම් 421,147 ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂය තුළ අපේක්ෂිත ඉලක්කයෙන් සියයට 42 ක් ළඟාකරගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ හපුගස්පිටිය වතුයායේ ඇස්තමේන්තුගත වියළි කොකෝවා ඇට ප්‍රමාණය කිලෝග්‍රෑම් 5,000 ක් වුවත් කොකෝවා ගස්වල ඵලදායී ජීව කාලය ඉක්මවා තිබීම හා වගාවන්ට රසායනික පොහොර නිසි පරිදි ලබා නොදීම හේතුවෙන් අපේක්ෂිත ඵලදාවෙන් සියයට 15 ක පමණ අඩු ඵලදාවක් සමාලෝචිත වර්ෂයේදී ලබාගෙන තිබුණි.

**4.1.1.2 පළාත් වතුයායන්වල කාර්යසාධනය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

**(අ) රත්වත්ත වතුයාය**

(i) පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී වතුයායේ තේ දළු අස්වැන්න කිලෝග්‍රෑම් 333,404 කින් එනම් සියයට 44 කින් පහළ ගොස් තිබුණි. වතුයායට අයත් හෙක්ටයාර් 173.30 ක ඉඩම් ප්‍රමාණයෙන් සියයට 43 ක ඉඩම් ප්‍රමාණයක් තේ වගාවන් සඳහා යොදවා නොතිබීම, පැරණි වගාවන් ඉවත්කර නව වගාවන් වලට යොමු නොවීම, පොහොර හා රසායන ද්‍රව්‍ය අඛණ්ඩව නොයෙදීම අස්වැන්න අඩු වීම සඳහා බලපා තිබුණි.

(ii) රත්වත්ත වතුයායේ බාහිර වැවිලිකරුවන්ට (Out Growers) ලබා දී තිබුණු හෙක්ටයාර් 108.42 ක භූමි ප්‍රමාණය මඟින් සමාලෝචිත වර්ෂයේදී නිෂ්පාදනය කළ තේ දළු ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 58,529 ක් වූ අතර එය 2015 වර්ෂයේ තේ දළු නිෂ්පාදනයට සාපේක්ෂව කිලෝ ග්‍රෑම් 29,676 ක අඩුවීමකි.

(iii) අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් 2015 වර්ෂයේ නිකුත්කළ තාක්ෂණික ප්‍රකාශනය අනුව පරිණත ගම්මිරිස් වැලක සාමාන්‍ය අස්වැන්න වසරකට වියළි ගම්මිරිස් කිලෝග්‍රෑම් 1 ත් කිලෝග්‍රෑම් 2.5 ත් අතර විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේදී වතුයායේ එම

අගය කිලෝග්‍රෑම් 0.3 සිට කිලෝග්‍රෑම් 0.5 අතර අඩු අගයක් විය. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රමිතීන්ට අනුව වගාවන් පවත්වා නොගැනීම හා නඩත්තු කටයුතු සිදු නොකිරීම හේතුවෙන් සමාගමේ ගම්මිරිස් ඵලදාව අඩුවී තිබුණි.

**(ආ) හපුගස්පිටිය වතුයාය**

**(i) රබර් වගාව**

රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශිත දත්ත අනුව 2016 වර්ෂයේ හෙක්ටයාරයක වාර්ෂික රබර් කිරි අස්වැන්න කිලෝග්‍රෑම් 819 ක් පැවතිය යුතු වුවද, වතුයායේ එම අගය කිලෝග්රෑම් 278 ක පමණ ඉතා අඩු මට්ටමක පැවතුණි. මේ සඳහා පරිනත රබර් වගාවෙන් සියයට 90 ක පමණ වගාවක ඵලදායී ජීව කාලය ඉක්ම වී පැවතීම හා පැරණි වගාවන් ඉවත්කර නව වගාවන් සඳහා යොමු නොවීම හා හෙක්ටයාරයකට රබර් පැල 550 ක් පැවතිය යුතු වුවත් වතුයායේ මෙම ප්‍රමාණය 215 ක පමණ ඉතා අඩු අගයක් පැවතීම බලපා තිබුණි.

**(ii) කොකෝවා වගාව**

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සම්මතයන්ට අනුව කොකෝවා පැලයක වාර්ෂික වියළි කොකෝවා ඇට ප්‍රමාණය කිලෝග්‍රෑම් 0.9 ත් කිලෝග්‍රෑම් 1.3 ත් අතර, විය යුතු වුවද වතුයායේ එම අගය ග්‍රෑම් 100 ක පමණ අඩු අගයක් විය. කොකෝවා ගසක ඵලදායී ජීව කාලය වර්ෂ 25 ත් වර්ෂ 30 ත් අතර වුවද, හපුගස්පිටිය වතුයායේ ඵල දරන කොකෝවා පැල 28,100 න් පැල 20,513 ක් එනම් සියයට 73ක් ඵලදායී ජීවකාලය ඉක්මවූ පැල වීම, පොහොර හා රසායනික ද්‍රව්‍ය අඛණ්ඩව භාවිතා නොකිරීම අඩු ඵලදාවක් ලැබීමට හේතු වී තිබුණි.

**(iii) පොල් ඵලදාව**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

- වතුයායේ පවතින පොල් වගාවෙන් සියයට 50 ක් පමණ ඵල නොදරන වගාවන් වීම හා රසායනික පොහොර අඛණ්ඩව නොයෙදීම හේතුවෙන් පොල් පර්යේෂණ ආයතනයේ සම්මතයන්ට අනුව ගසක වාර්ෂික සාමාන්‍ය ඵලදාව පොල් ගෙඩි 72 ක් වුවද වතුයායේ එම ඵලදාව පොල් ගෙඩි 04 ත් 31 ත් අතර අඩු පරාසයක පැවතුණි.

- පොල් පර්යේෂණ ආයතනයේ සම්මතයන්ට අනුව හෙක්ටයාරයක පැවතිය යුතු පොල් ගස් ප්‍රමාණය ගස් 158 ක් වුවත් වතුයායෙහි ක්ෂේත්‍ර 05 ක එම අගය 3 ත් 120 ත් අතර පරාසයක පැවතුණි. අඩු ගස් ප්‍රමාණයට නැවත පොල් පැල වගා කර නොතිබූ අතර පවතින වගාවන් ආරක්ෂා කරගැනීමට කටයුතු කර නොතිබුණි.

- සමාගම විසින් 2007 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලය තුල මෙම වතුයායේ ආරම්භ කරන ලද පොල් වගාවෙන් සියයට 31 ක්ද, රබර් හා තේක්ක වගා වලින් සියයට 12 ක්ද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විනාශ වී පැවතුණි. මේ සඳහා ප්‍රමාණවත් ජල සැපයුමක් ලබා නොදීම හා වල් නෙලීම සිදු නොකිරීම, පොහොර හා රසායනික ද්‍රව්‍ය අඛණ්ඩව භාවිතා නොකිරීම යන කරුණු බලපා තිබුණි. කෙසේ වුවද මෙම වගාවන් සඳහා 2007 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එකතුව රු.14,160,233 ක වියදමක් දරා තිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සෙලගම වතුයායේ අක්කර 3 රූඩ් 2 පර්චස් 22 ක ප්‍රමාණයක් පෞද්ගලික සමාගමකට 2006 ජූනි 01 දින සිට වසර 30 ක කාලයක් සඳහා බදු දී තිබූ අතර එම ගිවිසුම ප්‍රකාරව සමාගමේ ලිඛිත අවසරයකින් තොරව බදුකරුහට උපබදු දීමට අවසර නොමැති වුවත් බදුකරු විසින් අදාල ඉඩම 2012 වර්ෂයේදී උප බදු දී තිබුණි. ඒ අනුව ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් කටයුතුකර නොතිබුණි.

(ආ) පන්සල්තැන්න වත්තට අයත් තේ කම්හල බදුදීම සඳහා බදු ගැණුම්කරු සමග 2013 වර්ෂයේදී එළඹෙන ලද අතුරු බදු ගිවිසුම අනුව බදු ගැනුම්කරුගෙන් රු.1,908,000 ක ආපසු ගෙවනු ලබන පොලී රහිත තැන්පතු මුදලක් ලබා ගත යුතු වුවත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් තැන්පතු මුදල් ලබා ගෙන නොතිබුණි.

(ඇ) ගංවතුර ආධාර ලබාදීම වෙනුවෙන් සමාගමේ ප්‍රධාන කාර්යාලයේ සහ වතු සේවකයින්ගෙන් එකතු කරන ලද රු.330,150 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී සමාගමේ බැංකු ගිණුමක තැන්පත් කර තිබූ අතර, 2017 ජනවාරි මාසයේදී සමාගමේ සභාපතිවරයා වෙත එම මුදල බාර දී තිබුණි. කෙසේ වුවද ගංවතුර ආධාර ලබාදුන් බවට ලේඛන සමාගම සතුව නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

සමාලෝචිත වර්ෂයේදී ඇල්කඩුව වතුයායෙහි සිදුකළ කරාබු ගස් සංගණනයේදී 2015 වර්ෂයේදී යොදන ලද අංක ඉවත් කර නව අංක යෙදීම සිදුකර තිබූ අතර එහිදී 2015 වර්ෂයේදී පැවති 3,470 ක් වූ කරාබු ගස් ප්‍රමාණය සමාලෝචිත වර්ෂයේදී ගස් 1,947 දක්වා එනම් ගස් 1,523 කින් අඩු වී තිබුණි. වතුයායේ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ මාසික ප්‍රගති වාර්තා අනුව අදාල සංගණන දිනය දක්වා කරාබු ගස් විනාශවීම් හෝ ඉවත් කිරීම් සම්බන්ධයෙන් තොරතුරු වාර්තාකර නොතිබුණි. ඒ සම්බන්ධව සමාගම විසින් සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නාලන්ද වතුයායේ අක්කරයක භූමි ප්‍රමාණයක පැවති මිනිරන් නිධිය කැනීම් කිරීම සඳහා 2014 වර්ෂයේදී ශක්‍යතා අධ්‍යයනයක් හා භූ විද්‍යා පරීක්ෂණ ආරම්භකර, ඒ සඳහා 2016 දෙසැම්බර් 31 දිනට රු.21,407 ක් වැයකර තිබුණද එම මිනිරන් නිධිය කැනීම 2017 ඔක්තෝබර් මස අවසානය දක්වාම ආරම්භ කිරීමට සමාගමේ කළමනාකාරීත්වය කටයුතු කර නොතිබුණි.

(ආ) රත්වත්ත වතුයායට අයත් හෙක්ටයාර් 5.04 ක කුඹුරු ඉඩමක් හා හෙක්ටයාර් 13.66 ක වගාකටයුතු සඳහා භාවිතා කළ හැකි භූමි ප්‍රමාණයක් කෘෂිකාර්මික කටයුතු සඳහා යොදා ගැනීමට හෝ බදු පදනම ලබා දීමට කටයුතු නොකර නිශ්කාර්යව පැවතුණි.

## 4.5 ආර්ථික නොවූ ගනුදෙනු

සමාගම විසින් සේවක අර්ථසාධක අරමුදලට, සේවක භාරකාර අරමුදලට, වතු සේවකයින්ගේ අර්ථසාධක සංගමය හා ශ්‍රී ලංකා වැවිලිකරුවන්ගේ අර්ථසාධක සංගමය සඳහා වර්ෂ 15ක සිට මාසිකව නිසි පරිදි දායක මුදල් ප්‍රේෂණය නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය වන විට පිළිවෙලින් රු.96,445,172 ක, රු.9,470,126 ක, රු.2,855,169 ක හා රු.2,449,229 ක දඩ මුදල් ගෙවීමට තිබුණි.

## 4.6 හඳුනාගන්නා ලද පාඩු

අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සුළු අපනයන භෝග මිල දර්ශකය අනුව 2017 මැයි 31 දිනට වියළි ගම්මිරිස් කිලෝග්‍රෑම් එකක සාමාන්‍ය වෙළඳපොළ මිල රු.1,398 ක් වූ අතර රත්වත්ත වතුයාය විසින් එම මිල ගණන් ඇගයීමකින් තොරව රු.850 ක මුදලකට අලෙවිකිරීම හේතුවෙන් සමාගමට අහිමි වූ ආදායම රු.206,048 ක් විය.

## 4.7 කාර්ය මණ්ඩල පරිපාලනය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ විධිමත් අනුමැතියකින් තොරව අනුමත කාර්ය මණ්ඩලයට අතිරේකව රහස්‍ය ලේකම්, කළමනාකරු (අලෙවි), මහජන සම්බන්ධතා නිලධාරී හා කළමනාකරු (MIS ) යන නව තනතුරු නාමයන් 4 ක් සඳහා පුද්ගලයන් හතරදෙනෙකු බඳවාගෙන සමාලෝචිත වර්ෂයේදී වැටුප් හා දීමනා ලෙස රු.2,460,576 ක් ගෙවා තිබුණි. තවද සමාගමේ සාමාන්‍යාධිකාරී තනතුරට 2012 වර්ෂයේ සිට ස්ථිර පදනම මත නිලධාරියකු පත් නොකර කොන්ත්‍රාත් පදනම මත නිළධාරීන් දෙදෙනෙකු පත්කර තිබුණි.

## 4.8 නොවිසඳී ඇති විගණන ඡේද

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 වර්ෂයේදී මාතලේ දිස්ත්‍රික්කයේ ඉදිකිරීම් නිමකර තිබූ සමාගමේ මෙහෙයුම් කාර්යාල වෙත කොළඹ ප්‍රධාන කාර්යාලය ගෙනයාමට පියවර නොගැනීම හේතුවෙන් එම ගොඩනැගිල්ල විනාශ වෙමින් පවතී.

(ආ) නෙලවුල්ල වතුයායේ මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර් 354.75 ක් වූ අතර මෙයින් හෙක්ටයාර් 229.75 කට ආසන්න භූමි ප්‍රමාණයක් අනවසර පදිංචිකරුවන් විසින් භුක්ති විඳින අතර 2018 දෙසැම්බර් වන තෙක් අනවසර පදිංචිකරුවන් ඉවත්කර මෙම භූමිය සමාගමේ භාවිතයට ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) වතු අධිකාරීවරු දෙදෙනෙකු විසින් සිදුකළ වැරදි සම්බන්ධයෙන් නඩු විභාගයක් සිදුවන අතරතුර එම නිලධාරීන් දෙදෙනා නැවත සේවයේ පිහිටුවීමට ක්‍රියාකර තිබුණි.

(ඈ) රත්වත්ත වතුයායේ කරාබු නැටි අලෙවි කිරීම සඳහා වූ ටෙන්ඩරය සිදු කිරීමේදී සිදු වූ රු.ලක්ෂ 15 ක පමණ මූල්‍යමය පාඩුවට අදාලව ටෙන්ඩර්කරුවන් 06 දෙනා කැඳවා සාක්ෂි සටහන් වාර්තාවක් පොදු ව්‍යාපාර කාරක සභාවට ඉදිරිපත් කළ යුතු වුවත් සමාගම අදාල වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු සමාගමේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමුකල අතර පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් කළමනාකරණය | බාහිර පාර්ශවයන් විසින් ඉඩම් අත්පත්කර ගැනීම්, වාහන නඩත්තු හා රක්ෂණ කටයුතු, තේ කර්මාන්තශාලා පවත්වාගෙන යාම දුර්වල මට්ටමක පැවතීම. |
| (ආ) | අයවැය ලේඛනමය පාලනය | අයවැය මගින් ඉලක්ක ස්ථාපිත කර තිබුණද ඒවා සපුරාගැනීමේ ක්‍රමවේදයේ හා අධීක්ෂණ ක්‍රියාවලියේ දුර්වලතා පැවතීම. |
| (ඇ) | ණයගැති හා ණයහිමි පාලනය | දිගුකාලීන ණය ශේෂ නිරවුල් කිරීමට හා අයකර ගැනීමේ ක්‍රියාවලියේ දුර්වලතා පැවතීම. |
| (ඈ) | මානව සම්පත් කළමනාකරණය | අනුමත බඳවාගැනීමේ පරිපාටියෙන් බැහැරව බඳවාගැනීම් සිදුකර තිබුණි. |